චක්‍රලේඛ අංක …………

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>02/2022 චක්‍රලේඛය ක්‍රියාත්මකවීමේදී වැටුප් විෂමතා මතුවී ඇති සමූපකාර සේවකයන්ට සහන සැලසීම සහ සමූපකාර සේවකයින් සඳහා පොදු දීමනා ක්‍රමවේදයක් හඳුන්වා දීම</u>**

මෙතෙක් පැවති සමූපකාර සේවක තනතුරු බඳවා ගැනීමේ සුදුසුකම් හා වැටුප් ක්‍රම සංශෝධනය කරමින් නිකුත් කල 02/2022 චක්‍රලේඛය මගින් සමූපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය අරමුණු කර ගන්නා ලදී.

02. සමිතිවල මෙතෙක් පැවති වැටුප් ක්‍රම විධිමත් කිරීමේ අරමණින් මෙම චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාවේ එහි 08 වන වගන්තිය මගින් ඒ ඒ සමිතිවල ඉල්ලීම මත සේවකයින්ට පොදුවේ හා පෞද්ගලික වන සේ මේ දක්වා අනුමත කර ඇති සියලු දීමනා අවලංගු කරන ලදී.

03. එම තීරණයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ එසේ මෙතෙක් ගෙවන ලද දීමනා වැටුපට එක් කර ගැලපෙන අනුරූපී වැටුප් ක්‍රමයක් තෝරාගැනීමට සමිතිවලට අවස්ථාව සැලසීමයි.

04. කෙසේ නමුත් වැටුප් ක්‍රමයක් තෝරාගන්නා අවස්ථාවේ මෙම කොමිෂන් සභාව අපේක්ෂා කළ තත්ත්වය ළඟා නොවීම මත 02/2022 චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර සමිති විසින් ගෙවන ලද ඒකාබද්ධ වැටුපට අඩු වැටුපක් හිමිවන බවට සමිති හා සේවකයන් රැසක් මෙම කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කර ඇත.
05. එම ඉල්ලීම් සියල්ල සලකා බලා එසේ මෙතෙක් ගෙවන ලද ඒකාබද්ධ වැටුපට වඩා මෙම වැටුප් ක්‍රමය හඳුන්වා දීමෙන් පසු අඩු වැටුප් ලබන සේවකයන් සඳහා පහත පරිදි කටයුතු කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

I. 2022.05.01 දිනෙන් පසු නව වැටුප් ක්‍රමය ක්‍රියාත්මකවීමේදී එතෙක් ලැබූ දීමනා අවලංගු වීම මත ඒකාබද්ධ වැටුප 2022.05.01 දිනට පෙර ලැබූ වැටුපට වඩා අඩු වී ඇත්නම් එසේ අඩුවී ඇති මුදල පමණක් ගැලපුම් දීමනාවක් ලෙස අදාළ නිලධාරීන්ට ගෙවීම.

II. ඉදිරියේදී නව වැටුප් ක්‍රමයක් තෝරාගැනීමේදී අදාළ වැටුප් හා දීමනා ආවරණය වන වැටුප් ක්‍රමයක් තෝරා ගැනීමට අදාල සමිති කටයුතු කල යුතුය.

06. එසේම, තම සමිතියේ මූල්‍ය ශක්‍යතාවය මත, සමිතියේ වැටුප් ක්‍රමය පදනම් කර ගනිමින් පහත සඳහන් දීමනාවන් ඉක්මවා නොයන පරිදි, තම සේවකයින්ට දීමනා ගෙවීම් කළ හැකි අතර, ඒ සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශ ලබා ගත යුතුය.

I. මෙම දීමනා සේවක අර්ථසාධක අරමුදලට සේවක අර්ථසාධක අරමුදලට, සේවක භාරකරු අරමුදලට, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා පාරිතෝෂික ගණනය සඳහා අදාළ කර නොගත යුතුය.

II. මෙහි සඳහන් දීමනා ගෙවීම හෝ නොගෙවීම, ගෙවන ප්‍රමාණය, තෝරාගනු දීමනා වර්ග යන සියල්ල සමිතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, සමිතියේ ලාභය යන කරුණු අනුව තීරණය කිරීමේ සම්පූර්ණ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

III. එසේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මගින් අනුමත කර ගත් දීමනාව/දීමනා ගෙවීම සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ අනුව සමුපකාර සංවර්ධන කොමසාරිස් නිර්දේශ සහිතව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**විධායක දීමනාව (ගෙවිය හැකි උපරිම සීමාව -රු.)**

| වැටුප් ක්‍රමය | EL 01 - ප්‍රධාන විධායක මට්ටම | EL – 02 මධ්‍ය විධායක මට්ටම | EL -03- කණිෂ්ඨ විධායක මට්ටම | SUL - අධීක්ෂණ මට්ටම |
|---|---|---|---|---|
| SP | 10000 | 9000 | 8000 | 7000 |
| A | 9000 | 8000 | 7000 | 6000 |
| B | 8000 | 7000 | 6000 | 5000 |
| C | 7000 | 6000 | 5000 | 4000 |
| D | 6000 | 5000 | 4000 | 3000 |

**දුරකතන දීමනා (ගෙවිය හැකි උපරිම සීමාව -රු.)**

| වැටුප් ක්‍රමය | EL 01 - ප්‍රධාන විධායක මට්ටම | EL – 02 මධ්‍ය විධායක මට්ටම | EL -03- කණිෂ්ඨ විධායක මට්ටම | SUL - අධීක්ෂණ මට්ටම |
|---|---|---|---|---|
| SP | 4000 | 3500 | 3000 | 2500 |
| A | 3500 | 3000 | 2500 | 2000 |
| B | 3000 | 2500 | 2000 | 1500 |
| C | 2500 | 2000 | 1500 | 1000 |
| D | 2000 | 1500 | 1000 | 750 |

## ප්‍රවාහන දීමනා (ගෙවිය හැකි උපරිම සීමාව -රු.)

| වැටුප් ක්‍රමය | EL 01 - ප්‍රධාන විධායක මට්ටම | EL – 02 මධ්‍ය විධායක මට්ටම |
|---|---|---|
| SP | 15000 | 12000 |
| A | 12500 | 10000 |
| B | 10000 | 7000 |
| C | 8000 | 5000 |
| D | 7500 | 4000 |

රාජකාරිය සඳහා තම පෞද්ගලික වාහනය විධිමත් අනුමැතියක් සහිතව රාජකාරිය සඳහා භාවිතා කරන නිලධාරීන්ට මෙම දීමනාව ගෙවිය හැකිය.

## විධායක නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව

රාජකාරී කටයුතු සඳහා නිල වාහනයක් සමිතිය මගින් ලබා දී ඇති හෝ තම පුද්ගලික වාහනය රාජකාරී කටයුතු සඳහා විධිමත් අනුමැතියක් සහිතව භාවිතා කරන **EL 01 , EL – 02** හා **EL – 03** මට්ටමේ නිලධාරීන්ට පිළිවෙලින් ඉන්ධන ලීටර් 50, 40 හා 30 යන උපරිම සීමාවට යටත්ව මාසික දීමානාවක් ගෙවිය හැකිය. මෙම දීමනා ගෙවීමේදී එක් එක් මාසයෙහි ආරම්භක දිනයෙහි වෙළඳපොලහි ඉන්ධන ලීටරයක පවතින මිල පදනම් කරගෙන අදාළ මාසික දීමනාව ගණනය කළ යුතුය.

## පැමිණීමේ දීමනා (ගෙවිය හැකි උපරිම සීමාව -රු.)

| වැටුප් ක්‍රමය | OPL 01 - මෙහෙයුම් මට්ටම - 1 | OPL – 02 මෙහෙයුම් මට්ටම - 2 | MSL-01 සහාය සේවා මට්ටම - 1 | MSL - 02 සහාය සේවා මට්ටම - 2 | MSL - 03 සහාය සේවා මට්ටම - 3 |
|---|---|---|---|---|---|
| SP | 9000 | 8000 | 7000 | 6000 | 5000 |
| A | 8000 | 7000 | 6000 | 5000 | 4000 |
| B | 7000 | 6000 | 5000 | 4500 | 3500 |
| C | 6000 | 5000 | 4000 | 3500 | 2500 |
| D | 5000 | 4000 | 3000 | 2500 | 2000 |

මෙම දීමනාව අදාළ මාසයේ වැඩ කරන සියලු දින වල සේවයට පැමිණීම මත මෙම දීමනාව ගෙවිය හැකිය.

**යතුරු පැදි දීමනාව (ගෙවිය හැකි උපරිම සීමාව රු.)**

| වැටුප් ක්‍රමය | SUL අධීක්ෂණ මට්ටම | OPL – 01 මෙහෙයුම් මට්ටම - 1 | OPL -01 සහාය සේවා මට්ටම - 2 |
|---|---|---|---|
| SP | 9000 | 8000 | 7000 |
| A | 8000 | 7000 | 6000 |
| B | 7000 | 6000 | 5000 |
| C | 6000 | 5000 | 4000 |
| D | 5000 | 4000 | 3000 |

ක්ෂේත්‍ර රාජකාරීවල නිරතවන SUL මට්ටමේ සිට OPL-02 මට්ටම සඳහා වන නිලධාරීන්ට ද, රාජකාරිය සඳහා තම පුද්ගලික යතුරු පැදිය භාවිතා කරීමට අවශ්‍ය වන නිලධාරීන්ට ද, සමිතියේ මූල්‍ය තත්වය සළකා ඉහත අනුව යතුරු පැදි දීමනාවක් ගෙවිය හැකිය.

**කාර්ය සාධන දීමනාව**

සමිතිය වාර්ෂිකව ලාභ ලබන අවස්ථාවන්හි එකී ලාභය මත සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගන්නා පිළිගත හැකි කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් මත සමිතියේ සේවකයින්ට සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය මත කාර්ය සාධන දීමනාවක් ගෙවිය හැකිය. එම දීමනාව එක් එක් වර්ෂයේ සමිතිය ලබන ලාභය මත තීරණය විය යුතුය.

**අවදානම් දීමනාව**

මෙහෙයුම් මට්ටමේ තනතුරුවල සේවයේ නියුතු OPL 1 හා OPL 2 මූල්‍යමය අවධානම් දරණ සේවකයින් සඳහා රු.5,000.00 ක උපරිමයකට යටත්ව අවදානම් දීමනාවක් ගෙවිය හැකිය.

07. ඉහත සඳහන් සියලුම දීමනා 06 හි සඳහන් සියලුම දීමනා අනුමත කර ගැනීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

I. එක් එක් දීමනා අතරින් කුමන දීමනාව/දිමනා තම සමිතියට අදාළ කරගත යුතුද යන්න සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම.

II. එක් එක් දීමනාව සම්බන්ධව මෙම චක්‍රලේඛයේ දක්වා ඇති උපරිම සීමාව දක්වා සමිතියේ මූල්‍ය ශක්‍යතාවය මත සමිතිය විසින් ගෙවනු ලබන සීමාව සම්බන්ධව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කිරීම.

III. එසේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහිතව අවශ්‍ය කරන වාර්තා ඇතුලත් කර, අදාළ ඉල්ලීම නිර්දේශ සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ නිර්දේශට යොමු කිරීම.

IV. සමිතිය විසින් තීරණය කර ඇති දීමනාව/දීමනා ගෙවීම සම්බන්ධව සමිතියට මූල්‍ය ශක්‍යතාවයන් පවතීද නැද්ද යන්න සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස් නිර්දේශ මෙම කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

V. අදාළ නිර්දේශ මත ඉල්ලා සිටින දීමනා සම්බන්ධව කොමිෂන් සභාවට යොමු කර අදාළ තීරණය සමිතියට දන්වා යැවීම.

08. ඉහත 06 වගන්තියෙහි සඳහන් දීමනා ගෙවීම/නොගෙවීම සම්බධව තීරණය කළ යුත්තේ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, මෙහි සඳහන් දීමනා අනිවාර්යයෙන් ගෙවිය යුතු බවත්, මෙම චක්‍ර ලේඛයේ විධිවිධාන මගින් අදහස් නොවේ. සමිතියේ මූල්‍ය ශක්‍යතාවය සළකා සමිතියේ මූල්‍ය කළමනාකරණයේ දී අගතියක් නොවන පරිදි අදාළ දීමනා අතරින් කවර දීමනා කොපමන ප්‍රමාණයකින් ගෙවනවාද යන්න තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන බව කාරුණිකව දන්වා සිටිමි.

මෙම චක්‍රලේඛය දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිට්‍රාර්ගේ එකඟතාවය මත නිකුත් කරන ලදී.